# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 366 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 01/03/2024<br>පැය 0945 |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් විශේෂ කාර්යාංශ නිලධාරීන්ගේ සේවය අගයා  ත්‍යාග මුදල් ලබා දීමේ උත්සවය**

පොලිස් විශේෂ කාර්යංශ නිලධාරීන්ගේ සේවය අගයා පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ලබා දීමේ උත්සවයක් පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් 2024.02.29 වන දින අපරාධ වාර්තා කොට්ඨාසයේදී පවත්වන ලදී.

නව පොලිස්පති ලෙස සිය රාජකාරි ආරම්භ කිරීමෙන් පසු ප්‍රථම නිල රාජකාරි උත්සවය ලෙස සහභාගී වෙමින් පොලිස්පතිතුමා විසින් පොලිස් විශේෂ කාර්යංශයට අනුයුක්ත පොලිස් නිලධාරීන් 95 දෙනෙකුට, ඔවුන්ගේ සේවය අගයමින් පොලිස් ත්‍යාග අරමුදලින් රුපියල් කෝටියකට ආසන්න මුදලක් පිරිනැමීම සිදු කරන ලදී.

මෙම අවස්ථාවට සමගාමීව  විශේෂ කාර්යාංශ පාපන්දු කණ්ඩායම විසින් ජී.එච් ෆගර්සන් අභියෝගතා කුසලාන අන්තර් කොට්ඨාස පාපන්දු තරඟාවලියේ සමස්ථ ශූරතාවය දිනා ගනිමින් විශේෂ කාර්යංශයට ගෙන දුන් කීර්තිය වෙනුවෙන් පාපන්දු කණ්ඩායමේ නිලධාරීන් 19 දෙනෙකුට මුදල් ත්‍යාග ලබා දී ඇත.

මෙම අවස්ථාවට අපරාධ හා රථවාහන දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා, පොලිස් විශේෂ කාර්යංශ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති තිලක් සී.ඒ ධනපාල මහතා, පොලිස් විශේෂ කාර්යංශයේ අධ්‍යක්ෂ නිශාන්ත සොයිසා මහතා ඇතුළු පොලිසියේ උසස් නිලධාරීන් පිරිසක් සහභාගී විය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**